## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/217/2025 (PSC)

ආර්.එම්.ගයනි බණ්ඩාර මැණිකේ,
**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.03.17**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක පෞද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, ජේ.එම්.දිසානායක මිය.

### -<u>නියෝගය</u>-

ආර්.එම්.ගයනි බණ්ඩාර මැණිකේ යන අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත, 2025.09.03 දින ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඇය ලක්වී ඇති හිංසාව සම්බන්ධයෙන් සොයා බලා, සාධාරණයක් ඉටුකර දෙන ලෙසටයි. ඒ හැරෙන්නට ඇයට නිකුත් කර ඇති අවවාද ලිපිය පෞද්ගලික ලිපි ගොනුවෙන් ඉවත් කර දෙන ලෙසටත්, 2023 වර්ෂයෙන් පසුව ලැබිය යුතු වැටුප් වර්ධක ලබා ගැනීමට කටයුතු සළසා දෙන ලෙසටත් ඇය විසින් ඉල්ලා ඇත. තවද, ඇයගේ රාජකාරී කටයුතු පවත්වා ගෙන යාමට අවස්ථාව සළසා දෙන ලෙසටත් වැඩිදුරටත් ඉල්ලා ඇත. ඉහත ඉල්ලීම් සළකා බැලීමේ දී මෙම විනිශ්චය අධිකාරයේ බලතල තුළට ඇතුළත් කර ගත හැකි ඉල්ලීමක් ලෙස සැළකිය හැකි බවට පෙනී යන්නේ, ඇය වෙත නිකුත් කර ඇති “**අවවාදය**” යන දඬුවම ඉවත් කර දෙන ලෙසට කර ඇති ඉල්ලීම පමණි.

ආයතන සංග්‍රහයේ 24:3 යටතේ වන “**අවවාදය**” යන දඬුවම, නිලධාරියෙකුගේ කාර්යක්ෂමතාවයට හෝ උසස්වීම් වලට බලනොපාන දඬුවමක් ලෙසට එහි පැහැදිලිව සඳහන් කර ඇත. ඒ බව අභියාචකට පහදා දෙන ලදි. තවද එම කරුණ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලයක් නොමැති බවටත්, එය අභියාචක සේවය කරන ස්ථානයේ දෙපාර්තමේන්තු

ප්‍රධානියා විසින් තීරණය කළ යුතු කරුණක් වන බවටත් අභියාචකට පහදා දෙන ලදි.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ, මෙම අභියාචනය සම්බන්ධයෙන් නියෝගයක් නිකුත් කිරීමට මෙම විනිශ්චය අධිකාරයට අවකාශයක් නොමැති බවයි. මෙම විනිශ්චය අධිකාරයට බලය හිමිවන්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණයක් සම්බන්ධයෙන් විමසා බලා ඒ අනුව උචිත නියෝගයක් කිරීමට පමණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණය වන, "**අවවාදය**" යන දඬුවම සම්බන්ධයෙන් නැවත පරීක්ෂා කරනු ලබන්නේ ඒ ඒ අවස්ථාවට අදාළ වන දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසිනි.

කෙසේ වෙතත් "**අවවාදය**" යන දඬුවම, දඬුවමක් ලෙස නොසැළකෙන බැවින්, ඒ සම්බන්ධයෙන් මැදිහත් වීමට අවශ්‍යතාවයක් පැන නගින්නේ ද නැත.

ඉහත හේතූන් සළකා බලා, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිශ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-